චක්‍රලේඛ අංක - 41

මගේ අංක - බ.කො.ජ/චක්‍රලේඛ/2013
2013.11.25

ස්යළුම බන්ධනාගාර අධිකාරී / සහකාර අධිකාරී වෙත

## බලපත්‍රමත සිරකරුවන් මුදාහැරීම

සිරකරුවන් බලපත්‍ර මත නිදහස් කිරීමට තෝරාගැනීම සඳහා ආයතනයේ අවුරුදු 2 හා ඊට අඩු සෑම සිරකරුවකුගේම විස්තර සඳහන් කර සෑම මසකම 30 දිනට පෙර බන්ධනාගාර මූලස්ථානයේ අධිකාරී (පුනරුත්ථාපන) වෙත ලැයිස්තුවකින් එවිය යුතුය. ඉන්පසු අනෙකුත් තොරතුරු පෙර පරිදි අදාල අංශ වෙත යැවිය යුතුය. එසේම තෝරාගන්නා සිරකරුවන් බලපත්‍ර මංඩලය රැස්වීමට සති දෙකකට පෙර වැලිකඩ බන්ධනාගාරයට මාරුකල යුතුය. ඔවුන් සඳහා දින 10ක උපදේශනය පිළිබඳව පාඨමාලාවක් ක්‍රියාත්මක කිරීමට නියමිත අතර එම පාඨමාලාව හැදෑරීමද බලපත්‍ර මන්ඩලයේ නිදහස් වීමට හේතුවක් වනු ඇත.

එබැවින් අවු 2 ක් හා ඊට අඩු සිරකරුවන්ගේ විස්තර සෑම මාසයකම 30 දිනට පෙර එවිය යුතු අතර, බලපත්‍ර මන්ඩලයට තේරී සිටින සිරකරුවන් බලපත්‍ර මංඩලයට ඉදිරිපත් කිරීමට සති දෙකකට පෙර වැලිකඩ බන්ධනාගාරය වෙත මාරුකිරීම කලයුතු අතර බන්ධනාගාර අධිකාරී වරයාගේ සෘජු මැදිහත්වීම මේ සඳහා අත්‍යාවශ්‍ය බව දන්වමි.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්